දැන්වීමයි

කොළඹ මහා නගර සභාව

ශ්‍රේණිගත පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ආදායම් පරීක්ෂක
III ශ්‍රේණියේ තනතුර සඳහා සිදීම ගැනීම -2026

කොළඹ මහා නගර සභාවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් උක් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ප්‍රාථමික සේවා ගණයක (PL-1,PL-2,PL-3) සේවකයින් සඳහා ඉල්ලුම් කල හැකිය. මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මේ සමඟ දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව, අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ **2026.06.26** දිනට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02.

I. තනතුරු නාමය : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාව
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - වණ්ඩ 2 සේවා ගණයේ
ආදායම් පරීක්ෂක III ශ්‍රේණිය

II. වැටුප් කේත අංකය : **MN 1-2025 (10/2025 අනුව)**

III. මාසික වැටුප් පරිමාණය :- **45230-10X540-11X630-10X890-10X1190-78360**

IV. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

V. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:
අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් **සම්මාන 02 ක් සහිතව විෂයන් 06ක් සාමාර්ථ ලබා තිබිය යුතුය.** මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.

VI. **පළපුරුද්ද :** අදාල පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාල සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුල කිසිදු විනය දඩුවමක් ලබා නොතිබිය යුතුය.

VII. **කායික සුදුසුකම් :** තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

VIII. **වෙනත් :** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදන සඳහන් වන දිනට සෑම් ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IX. **වයස් සීමාව :** අදාළ නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:-

නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයකින් සමත්ව සිටීම හා සම්මුඛ පරීක්ෂණ තුළින් (සම්මුඛ පරීක්ෂණ නුදෙක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි) සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් තෝරා පත් කරනු ලැබේ.

04. ලිඛිත විභාග:-

විෂයන්	උපරිම ලකුණු	අවම ලකුණු
සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය	100	40%
ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම	100	40%

05. බඳවා ගන්නා සංඛ්‍යාව **10** ක් පමණි.

ආදායම් පරීක්ෂක III ශ්‍රේණියට බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධාරියා වන නාගරික කොමසාරිස් සතු වේ.

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

ඒ.ඩී.එස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

2026 ජූනි මස **01** වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.